## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) හා තාක්ෂණ සහායක (කෘෂි පර්යේෂණ) තනතුරුවල III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

## Department of Agriculture

### Open Competitive Examination For the Recruitment to Grade III of Technological Assistant (Agriculture Extension) and Technological Assistant (Agriculture Research) of the Department of Agriculture

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) හා තාක්ෂණ සහායක (කෘෂි පර්යේෂණ) තනතුරුවල III ශ්‍රේණියේ 2024.10.30 දිනට පවතින පහත පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගයට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) | 101 |
| තාක්ෂණ සහායක (කෘෂි පර්යේෂණ) | 12 |

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.12.26** දින වන අතර, එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 35 ට නොවැඩි විය යුතු ය.

03. විභාගයට ඉදිරිපත් වන අපේක්ෂක අපේක්ෂිකාවන් අයදුම්පත භාරගන්නා අවසන් දින වනවිට පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

| *තනතුර* | *7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම්* |
|---|---|
| තාක්ෂණ සහයක ( කෘෂි ව්‍යාප්ති / කෘෂි පර්යේෂණ) | තනතුරේ කාර්යභාරයට අදාළව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ (05) හෝ ඉන් ඉහළ මට්ටමකට ඇතුළත් වන්නා වූ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම |

03.2 වෙනත් සුදුසුකම් :-

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති බවට සහතික විය යුතු ය.

- ❖ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- ❖ විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතු ය.
- ❖ යම් ආගමක, නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
- ❖ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තරම් සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත ද විය යුතු ය.

***සැලකිය යුතුයි -*** අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වනවිට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

05. වැටුප් :-

වැටුප් කේත අංකය - MT- 01 (2025)
වැටුප් පරිමාණය - රු 50090 - 10 x 540 – 11 x 630 – 10 x 1010 – 10 x 1190 – රු. 84420/=

06. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු ය. තවද ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා ඔබ විසින් දායක මුදල් ගෙවිය යුතු ය.

II. නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

III. දැනට බලාත්මක බඳවා ගැනීම් පරිපාටියේ කොන්දේසි හා ඉදිරියේ දී කරනු ලැබිය හැකි බඳවා ගැනීම් පරිපාටියේ සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු ය.

07. අයදුම් කළ යුතු ක්‍රමය :-

(අ) මෙම විභාගය සඳහා වූ අයදුම්පත් ආකෘතිය මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. ඒ අනුව අයදුම්පත A 4 (21cm x 30cm) පරිමාණයේ කඩදාසියක පමණක් දෙපැත්තේම පිළියෙල කළ යුතුවේ. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවට ද 04 සිට 07 තෙක් දෙවන පිටුවට ද 8 සිට 11 තෙක් තුන්වන පිටුවට ද ඉතිරිය 04 පිටුවට ද වන ලෙස සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත්අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ

සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025.12.26** දින හෝ එදිනට ප්‍රථම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් , පාලන 01 ශාඛාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පරණ ගලහ පාර, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ඈ) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක කෘෂි ව්‍යාප්ති /කෘෂි පර්යේෂණ තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2025"** යනුවෙන් සඳහන් කළ යුතුය. තනතුරු දෙකම සඳහා එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතු අතර එම තනතුරු දෙක සඳහාම අයදුම්කරන්නේ නම් අයදුම්පතේ අංක 02 හි ඔබගේ කැමැත්ත පරිදි අනුපිළිවෙළ සඳහන් කළ යුතු ය.

(ඉ) මෙම තනතුරු දෙක සඳහා විභාග ගාස්තුව රු.1000.00. ක් වන අතර එම ගාස්තුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් මහජන බැංකුව පේරාදෙණිය ශාඛාවේ ඇති අංක 057-100179027204 දරන ගිණුමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙත මුදලින් ගෙවා, අයදුම්කරු නමින් ලබා ගන්නා ලද ලදුපත, අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ එක් පසකින් පමණක් ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම මතුවට ප්‍රයෝජනවත්වනු ඇත.

(ඊ) අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපැලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

08 **විභාග පරිපාටිය**

(අ) නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින මාධ්‍යය හා ඉල්ලුම් කරන තනතුර ද අයදුම්කරුගේ සහතික කරන ලද අත්සන ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත .අපේක්ෂකයකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රජයේ හෝ රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා අත්සන සහතික කරවාගත යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ආ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය වෙත දන්වා සිටිය යුතුය.ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපතක් ද විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපතක් ද අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සමඟ ඉල්ලුම් කරන ලද විභාගයේ නම ,ඔබගේ නම ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කොට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, මහනුවරින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ,ඉහත විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මඟින් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මඟින් යොමු කර විමසා සිටීම ද වඩාත් ඵලදායීවනු ඇත.

(ඇ) විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය .ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය .එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට

ඇතුළත් කර නොගනු ඇත .තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

(ඈ) විෂය නිර්දේශය -

1. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 1 යි ,මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල හැකියාව ,ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිළියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

2. තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය (කාලය පැය 1 යි, මුළු ලකුණු 100)

අපේක්ෂකයාගේ විෂයානුබද්ධ දැනුම පිළිබඳ ව්‍යුහගත ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි.

| *තනතුර* | *විෂය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 1.තාක්ෂණ සහයක (කෘෂි ව්‍යාප්ති / කෘෂි පර්යේෂණ) | බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටළු විසඳීම් හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස්කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය, දේශගුණය හා කාලගුණය, පස, වී වගාව, වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව, එළවළු හා අල බෝග වගාව, පළතුරු වගාව, බෝග ආරක්ෂණය, ජල සම්පාදන හා ජල වහනය, කෘෂි යන්ත්‍රෝපකරණ, ගෙවතු වගාව, ආරක්ෂිත බෝග වගාව, මල් වගාව, මී මැසි පාලනය, සත්ව පාලනය, කෘෂිකාර්මික ව්‍යාප්තිය හා සම්බන්ධ මූලික කරුණු, කෘෂිකර්ම සංවර්ධනය |

(ඉ) මාධ්‍යය -

විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලිනි .අපේක්ෂකයින් විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය .ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ඊ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

(උ) විභාගය පවත්වන ස්ථානය හා දිනය

මෙම විභාගය **2026 පෙබරවාරි** මාසයේ දී මහනුවර දී කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

**08.** **බඳවා ගැනීමේ ක්‍රමය**

I. ඉහත විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම් සඳහා සලකා බලනු ලැබේ.

II. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම විභාගයේ ලකුණු කුසලතා අනුපිළිවෙල පදනම් කර ගෙන අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරා ඇති ඉහළම ලකුණු ලබා ගත් අය පමණක් පුරප්පාඩු සඳහා තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනමනු නොලැබේ.)

III. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

IV. කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේ දී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.

i. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
ii. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

V. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

VI. නිවේදනයේ සඳහන් සුදුසුකම්, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර නොමැතිව තිබිය දී විභාගයට ඉදිරිපත්ව විභාගය සමත් වුව ද සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා නොබලන අතර කිසිදු දැනුම් දීමකින් තොරව ඔහුගේ / ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VII. ව්‍යාජ තොරතුරු හා කූට ලේඛන ඉදිරිපත් කර යම් අයකු පත්වීමක් ලබාගත්තේ වුව ද ඒ බව අනාවරණය වූ වහාම ඔහුගේ / ඇයගේ පත්වීම අවලංගු කිරීමට හා ඔහුට / ඇයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

09. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය **ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමආරච්චි,**
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 11 දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.